*සැ. යු.*-2020.09.18 දින පළවූ අංක 2193/56 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අවලංගු කරන ලදී.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,195 - 2020 සැප්තැම්බර් මස 25 වැනි සිකුරාදා - 2020.09.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1430 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1443 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 ඔක්තෝබර් මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ඔක්තෝබර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1427 B 82061 — 5,403 (2020/09)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ක්‍රීඩා නිලධාරී තනතුර සඳහාවන සීමිත බඳවා ගැනීම - 2020

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ක්‍රීඩා නිලධාරී තනතුර සඳහාවන සීමිත බඳවා ගැනීම වෙනුවෙන් 2020.09.04 පළකරන ලද *ගැසට්* නිවේදනයේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2020.09.25 ලෙස සංශෝධනය කරන ලදී.

අනුරාධ විජේකෝන්,
ලේකම්,
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය.

09-797

---

## බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

### සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

### රාජ්‍ය නැටුම් කණ්ඩායමේ නැටුම් ශිල්පී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නැටුම් කණ්ඩායමේ පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත දැක්වෙන සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ අයදුම්පත් 2020.10.09 දින හෝ ඊට පෙර ලැබෙන සේ ''අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "නැටුම් ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත)" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම දැන්වීම www.culturaldept.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකි ය.

01. සේවයේ නියුක්ත කරවීම සහ සේවා කොන්දේසි :

i. කොන්ත්‍රාත් පදනමින් පත් කරනු ලබන අතර වසර 03 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්කෙරේ.
ii. වැටුප රු.33,600 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

02. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

i. *අධ්‍යාපන සුදුසුකම් :*
අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව නර්තන විෂය ඇතුළුව විෂයයන් හයක් (06) සමත් වීම;

හා

ජාතික තරුණ සේවා සභාව මගින් පවත්වනු ලබන නර්තන ඩිප්ලෝමා පාඨමාලාව හදාරා සමත්ව තිබීම;

හෝ

රජය විසින් පිළිගනු ලබන නර්තන විෂය සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම;

හෝ

ජාතික නැටුම් ප්‍රාරම්භක විභාගය සමත්වීම.

ii. *වෘත්තීය සුදුසුකම් :* අදාළ නොවේ
(යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ)

iii. *පළපුරුද්ද :*
රජයේ අනුමත කලායතනයක හෝ ඊට සමාන ආයතනයක නැටුම් ශිල්පියෙකු වශයෙන් වසර 03ක පළපුරුද්ද;
හෝ
පාරම්පරික නර්තන ශිල්පියකු වීම. (ලිඛිතව සනාථ කළ යුතුය)

iv. *කායික සුදුසුකම් :*
  i. සෑම අපේක්ෂකයෙකුම තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
  ii. උස අඩි 5 යි අඟල් 2 කට නො අඩු විය යුතුය.

v. *වෙනත් සුදුසුකම් :*
  i. සියලුම අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
  ii. තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
  iii. නර්තන / වාදන සියලුම අංශවල ප්‍රවීණතාවය සලකනු ලැබේ.

03. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නො අඩු සහ අවුරුදු 25ට නොවැඩි විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :

- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.
- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී සහ වෘත්තීය පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

*යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය* :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| 2. අදාළ ක්ෂේත්‍රය තුළ ලබා ඇති පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුය) | 35 | |
| 3. වෘත්තීය සුදුසුකම්<br>i. ප්‍රවීණ ශිල්පීන් යටතේ ජාතික තලයේ නිර්මාණවලට සහභාගී වී තිබීම.<br>ii. සංස්කෘතික මධ්‍යස්ථාන මගින් හෝ ප්‍රවීණ ශිල්පීන් සමඟින් විදේශ ප්‍රසංගවලට සහභාගී වී තිබීම | 25 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

*වෘත්තීය පරීක්ෂණය* :

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. ශිල්පීය දක්ෂතාව | 30 | 15 |
| 2. රේඛා හැඩතල සහ තාල ඥානය | 20 | 10 |
| 3. පෙනුම (උස/මහත) | 20 | 10 |
| 4. විශේෂ කුසලතා | 20 | 10 |
| 5. න්‍යායාත්මක දැනුම | 10 | 05 |
| එකතුව | 100 | 50 |

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* :

අයදුම්පත්‍ර පිරවීමේදී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර නිවැරදිව ඇතුළත් කළ යුතු අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. තනතුරු ලබාගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

07. අයදුම්පතෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරැදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද පත්කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

තරණි අනෝජා ගමගේ,
අධ්‍යක්ෂ (වැ.බ.),
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

2020 සැප්තැම්බර් මස 25 වැනි දින,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම් පත්‍රය**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා : [ ]

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නැටුම් ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

01. මුලකුරු සමඟ නම :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
03. උපන් දිනය :————.
04. වයස (2020.10.09 දිනට) :————.
05. උස : අඩි ............ අඟල් ............
06. ජාතික හැඳුනුම්පත් අංකය :————.
07. ස්ත්‍රී / පුරුෂ භාවය :————.
08. ලිපිනය :————.
09. දුරකථන අංකය :————.
10. අධ්‍යාපන සුදුසුකම් :————.

i. අ.පො.ස. (සා/පෙළ) :

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂය | ලබාගත් සාමාර්ථය | විෂය | ලබාගත් සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

ii. ජාතික තරුණ සේවා සභාව මගින් පවත්වනු ලබන නර්තන ඩිප්ලෝමා පාඨමාලාව/රජය විසින් පිළිගනු ලබන නර්තන විෂය සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලාව/ජාතික නැටුම් ප්‍රාරම්භක විභාගය

| වලංගු වන දිනය | සමත් විභාගය | ආයතනය |
|---|---|---|
| | | |
| | | |

11. වෘත්තීය සුදුසුකම් :————.

12. පළපුරුද්ද :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවද, මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සකු වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

අයදුම්කරුගේ අත්සන :————.

දිනය :————.

09-803/1

---

**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**රාජ්‍ය සංගීත කණ්ඩායමේ සංගීත ශිල්පී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සංගීත කණ්ඩායමේ පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත දැක්වෙන සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් 2020.10.09 දින හෝ ඊට පෙර ලැබෙන සේ ''අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "සංගීත ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත)" යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම දැන්වීම www.culturaldept.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකිය.

01. *සේවයේ නියුක්ත කරවීම සහ සේවා කොන්දේසි* :

i. කොන්ත්‍රාත් පදනමින් පත් කරනු ලබන අතර වසර 03 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත් කෙරේ.

ii. වැටුප රු.33,600/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

02. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :

i. *අධ්‍යාපන සුදුසුකම්* :
අධ්‍යාපන පොදු සහතිකපත්‍ර උසස් පෙළ විභාගයේදී සංගීත විෂය ඇතුළුව විෂයයන් තුන (03)කින් සමත් වීම**;**

හා

ජාතික සංගීත අවසාන විභාගය සමත්වීම හෝ භාත්ඛණ්ඩේ විද්‍යා පීඨයේ සංගීත විශාරද විභාගය සමත්වීම**;**

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සංගීත විෂය සම්බන්ධව උපාධියක් ලබා තිබීම.

ii. *වෘත්තීය සුදුසුකම්* : අදාළ නොවේ
(යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ)

iii. *පළපුරුද්ද* :
රජය විසින් පිළිගත් කලායතනයක හෝ සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් ඊට සමාන ආයතනයක් වශයෙන් පිළිගනු ලබන කලායතනයක සංගීත ශිල්පියෙකු වශයෙන් වසර 05ක පළපුරුද්ද;

හෝ

පාරම්පරික සංගීත ශිල්පියකුවීම (ලිඛිතව සනාථ කළ යුතුය)

iv. *කායික සුදුසුකම්* :

i. සෑම අපේක්ෂකයෙකුම තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
ii. උස අඩි 5 යි අඟල් 3 කට නො අඩු විය යුතුය.

v. *වෙනත් සුදුසුකම්* :

i. සියලුම අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ii. තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

iii. ගායන / වාදන සියලුම අංශවල ප්‍රවීණතාවය සළකනු ලැබේ.

03. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නො අඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :

- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා භාජනය කරන අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් සහ වෘත්තීය පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව එම තනතුරට බඳවා ගනු ලැබේ.

*යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :*

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදළ නොවේ |
| 2. අදාළ ක්ෂේත්‍රය තුළ ලබා ඇති පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුය) | 35 | |
| 3. වෘත්තීය සුදුසුකම්<br>i. ප්‍රවීණ ශිල්පීන් යටතේ ජාතික තලයේ නිර්මාණවලට සහභාගි වී තිබීම.<br>ii. සංස්කෘතික මධ්‍යස්ථාන මගින් හෝ ප්‍රවීණ ශිල්පීන් සමඟින් විදේශ ප්‍රසංගවලට සහභාගි වී තිබීම | 25 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

*වෘත්තීය පරීක්ෂණය :*

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. ප්‍රධාන විෂය (ගායනය/වාදනය) | 60 | 30 |
| 2. අනු විෂය (ගායන ශිල්පීන් සඳහා වාදන/වාදන ශිල්පීන් සඳහා ගායනය) | 20 | 10 |
| 3. ස්වර ප්‍රස්ථාර කියවීමේ/ලිවීමේ හැකියාව | 20 | 10 |
| එකතුව | 100 | 50 |

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*
අයදුම්පත් පිරවීමේදී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර නිවැරදිව ඇතුළත් කළ යුතු අතර,යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.
1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. තනතුරු ලබාගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

07. අයදුම් පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද පත්කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

තරණී අනෝජා ගමගේ,
අධ්‍යක්ෂ (වැ.බ.)
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

2020 සැප්තැම්බර් මස 25 වැනි දින,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංගීත ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

01. මුලකුරු සමඟ නම :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
03. උපන් දිනය :————.
04. වයස (2020.10.09 දිනට) :————.
05. උස : අඩි ............ අඟල් ............
06. ජාතික හැඳුනුම්පත් අංකය :————.
07. ස්ත්‍රී / පුරුෂ භාවය :————.
08. ලිපිනය :————.
09. දුරකථන අංකය :————.
10. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ.පො.ස. (උ/පෙළ) :

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

(ii) ලබාගත් උපාධිය :

| *වලංගු වන දිනය* | *ක්ෂේත්‍රය* | *ආයතනය/විශ්ව විද්‍යාලය* |
|---|---|---|
| | | |
| | | |

(iii) ජාතික සංගීත අවසාන විභාගය/භාත්ඛණ්ඩේ විද්‍යා පීඨයේ සංගීත විශාරද විභාගය :

| *වලංගු වන දිනය* | *සමත් විභාගය* | *ආයතනය/විශ්ව විද්‍යාලය* |
|---|---|---|
| | | |
| | | |

11. වෘත්තීය සුදුසුකම් :————.

12. පළපුරුද්ද :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද, මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

අයදුම්කරුගේ අත්සන :————.

දිනය :————.

09-803/2

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2020**
**වාරිමාර්ග අමාත්‍යාංශය**

වාරිමාර්ග අමාත්‍යාංශයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව (01) පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) *පළපුරුද්ද :*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුන (03) කට නොඅඩු නීතිඥවරයකු වශයෙන් සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රිය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, දිනය හා නිල මුද්‍රාව පැහැදිළිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.)**;**

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර තුන (03) කට නොඅඩු, පහත දැක්වෙන කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම.

(i) නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම,
(ii) ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු,
(iii) අදාළ අණපනත් සම්බන්ධව නෛතික කටයුතු,
(iv) පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු,
(v) විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු.
(මෙම කරුණු ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නිකුත් කළ සහතිකයකින් සනාථ කළ යුතුය.)

(iii) *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) *වෙනත් සුදුසුකම් :*

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තවද ඔබ වැන්දඹු අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට හා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

ii. මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iii. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව තනතුරට බැඳී වසර පහක් (05) ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුණු නිළධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව :* ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 (SL-1-2016) මාසික වැටුප් පරිමාණයක් හිමි ය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමිවේ.)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *අනු. අංකය* | *විෂය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | ***අතිරේක අධ්‍යාපන සුදුසුකම් :*** | | **25** |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද ක්ෂේත්‍රයට අදළ පශ්චාත් උපාධිය | 25 | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා ලද පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් නීති ඩිප්ලෝමාව (වසරකට නොඅඩු) | 20 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගන්නා ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | ● පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | ● දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | ● දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 05 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 05 | |
| | ***සටහන*** : ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 05ක් ලබා දිය යුතුයි. (උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |

| අනු. අංකය | විෂය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 02 | *අතිරේක වෘත්තීය පළපුරුද්ද* | | **35** |
| | (i) *අතිරේක වෘත්තීය සුදුසුකම් :*<br>රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාල ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට වැඩි ඩිප්ලෝමාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 10 කි.)<br><br>රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට වැඩි හා අවුරුද්දකට අඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)<br><br>රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට වැඩි හා මාස 06කට අඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>(එක් පාඨමාලාවකට ලකුණු 03 බැගින්)<br><br>**(අංක 01 යටතේ වන ලකුණු ලබා දුන් සහතික හැර වෙනත්)** | 10 | |
| | (ii) *අතිරේක පළපුරුද්ද :*<br><br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද<br>(එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 25ක්)<br>(මාස 06කට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02)<br><br>(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නිතීඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර)<br><br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.)<br><br>(ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරීන් හෝ පෞද්ගලික අංශයේ නිලධාරීන් සඳහා ආයතන ප්‍රධානී විසින් අතිරේක පළපුරුද්ද සනාථ කිරීමේ දී අයදුම්කරු නීතිමය තනතුරක සේවය කරන බවට සේවා සහතිකයක්/සහතික පත් මගින් සනාථ කළ යුතු ය.) | 25 | |
| 03 | **භාෂා ප්‍රවීණතාව**<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය<br><br>(අදාල විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය) | 15 | **15** |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500) | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | -මාස 06/පැය 720 | 07 | |
| | -මාස 03/පැය 360 | 05 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |

| *අනු. අංකය* | *විෂය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 04 | ***තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :***<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා<br>-මාස 06/පැය 720<br>-මාස 03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | 10<br><br><br>07<br><br>05<br>03 | **10** |
| 05 | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව :**<br>(i) සාමාන්‍ය දැනීම හා බුද්ධිය<br>(ii) නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම<br>(iii) පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය | 05<br>05<br>05 | **15** |
| | **මුළු එකතුව** | | **100** |

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
- සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.
- සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ. :

  I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය,
  II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්පත් 2020 ඔක්තෝබර් මස 23 දිනට හෝ එදිනට ප්‍රථම වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත්, 02 වන පිටුව අංක 04 සිට 06 දක්වාත්, 03 වන පිටුව අංක 07 සිට 08 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''නීති නිලධාරී තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු /ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 47,615 ක) මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :-
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් හෝ ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

12. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
වාරිමාර්ග අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 09 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*වාරිමාර්ග අමාත්‍යාංශයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2020*

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
සිංහල - 1/දෙමළ - 2/ඉංග්‍රීසි - 3
*සටහන* - අයදුම් කරන භාෂා මාධ්‍යය වෙනස් කළ නොහැක.

---

1.0 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය):————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 මුලකුරු සමග නම (මයා/මිය/මෙය) :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා. GUNAWARDHANA, M. G. B. S. K.

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය ඃ පුරුෂ 0 ☐
ස්ත්‍රී 1

3.2 විවාහක/අවිවාහක බව ඃ විවාහක - 1 ☐
අවිවාහක - 2

3.3 උපන් දිනය ඃ වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4 2020.10.23 දිනට වයස ඃ අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.5 ජාතික හැඳුනුම්පත් අංකය ඃ ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.0 4.1 සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව ලබාගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තර ඃ

| *සුදුසුකම් ලබාගත් ආයතනය* | *ලබාගත් දිනය* |
|---|---|
| ..................................... | .................. |
| ..................................... | .................. |

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

4.2 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර ඃ

4.3 අතිරේක අධ්‍යාපන සුදුසුකම් ඃ ..............................................................................
..............................................................................

4.4 අතිරේක වෘත්තීය සුදුසුකම් ඃ ..............................................................................
..............................................................................

4.5 අතිරේක පළපුරුද්ද ඃ..............................................................................
..............................................................................

4.6 භාෂා ප්‍රවීණතාව ඃ..............................................................................
..............................................................................

4.7 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ඃ.......................................................................
.......................................................................

5.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
(අදාළ කොටුවේ ( ✓ ) ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

.....................................................................................................................

6.0 අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

————.
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සම්පූර්ණ නම :————.
තනතුර :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

8.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත විස්තර සඳහන් ............................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදයක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව යොදන්න.)

09-802

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය

### වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය

### සහකාර නැව් ගමන් නිලධාරි සේවයේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020

1.0. වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයේ ආශ්‍රිත සේවා ගණය (සහකාර නැව් ගමන් නිලධාරි, නැව් ගමන් නිලධාරි) සඳහා වන බඳවා ගැනීම් පරිපාටියේ 08 ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව සහකාර නැව් ගමන් නිලධාරි III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2020 දෙසැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0. සහකාර නැව් ගමන් නිලධාරි III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ නගරයේදී පමණක් පැවැත්වේ.

3.0. (i) මෙම විභාගය කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0. *සුදුසුකම්.*- සහකාර නැව් ගමන් නිලධාරි III ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

5.0. අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත අනුව අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත අයදුම්කරුවන් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2020 ඔක්තෝබර් මස 23 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

6.0. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ. :

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

7.0. (i) *අයදුම්පත්.*- ආදර්ශ අයදුම්පතේ අංක 1.0 සිට 6.0 තෙක් ඡේද පළමුවන පිටුවටද ඉතිරිය අනෙක් පිටුවලටද ඇතුළත් වන පරිදි ''ඒ4'' ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත පිළියෙල කළ යුතුය. අයදුම්පත යතුරු ලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කරගත යුතු අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත්කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් අයදුම්කරු විසින් නැවත විමසා බැලිය යුතු අතර, එම අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.*- ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත්

විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

(iii) පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු. 500 ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 250 ක් ද විභාග ගාස්තු වශයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බවද කාරුණිකව දන්වමි. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

8.0. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පතේ පිටපතද විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපතද අතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, ඔබගේ ඉහත විස්තර සහ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින් ම විමසා සිටීම ද වඩාත් ඵලදායී වනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

*සටහන.*-අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

9.0. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

10.0 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

11.0. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ලැබූ, පළමු වතාවට විභාගයට පෙනී සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

12.0. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පැවැත්වේ. අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

13.0. තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතෙකුදු වුවත් සාමර්ථ්‍යය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) බැගින් ලබාගත යුතුවේ. (වැඩි විස්තර සඳහා වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ ආශ්‍රිත සේවා ගණය (සහකාර නැව් ගමන් නිලධාරි, නැව් ගමන් නිලධාරි) සඳහා වන බඳවා ගැනීම් පරිපාටියේ ඇමුණුම 01 බලන්න.)

14.0. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරීන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කළ යුතු අතර ඒවා එම භාෂාවෙන් ම පිරවිය යුතුය.

15.0. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ශ්‍රී ලංකා විභාග

දෙපාර්තමේන්තුව මගින් වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ නාවික ලේකම් කාර්යාලය වෙත ලබාදෙනු ඇත.

16.0. *විභාග පරිපාටිය.-* අයදුම්කරුවන් පහත දක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| *විෂයය* | *ලකුණු* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|
| 1. ආයතන හා කාර්ය පටිපාටි සංග්‍රහය | 100 යි | පැය 01 යි | 01 |
| 2. මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | 100 යි | පැය 01 යි | 02 |

16.1. ආයතන හා කාර්ය පටිපාටි සංග්‍රහය :

ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයේ I,II,VII,XIV,XXIV,XXVII,XXVIII,XXX, XXXIII හා 2 වන කාණ්ඩයේ XLVIII පරිච්ඡේද

16.2. මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම :

මුදල් රෙගුලාසි සංග්‍රහයේ I,IV,V,VI,VIII,XIII වැනි පරිච්ඡේද හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය.

17.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැලකිය යුතුය. තව ද, මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

ඒ. ඩබ්. සෙනෙවිරත්න,
වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්.

2020 සැප්තැම්බර් මස 25 වැනි දින,
වෙළඳ නාවික ලේකම් කාර්යාලය,
වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය,
පළමු මහළ, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල, 43-89, යෝක් වීදිය,
කොළඹ 01.

ආදර්ශ අයදුම්පත

**සහකාර නැව් ගමන් නිලධාරි සේවයේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020**

***First Efficiency Bar Examination of Assistant Shipping Officer Service - 2020***

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

අයදුම් කරන භාෂා මාධ්‍ය හා ප්‍රාදේශීය කාර්යාලය (අදළ අංකය මෙම කොටුවෙහි සඳහන් කරන්න.) :

සිංහල - 2

දෙමළ - 3

ඉංග්‍රීසි - 4

1.0

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 කාර්යාලයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

5.0 දුරකථන අංකය :

6.0 ඔබ ඉදිරිපත් වන විෂයය/විෂයයන් :

| විෂය | විෂය අංකය |
|---|---|
| 1. | |
| 2. | |

7.0 දනට දරන තනතුර :
7.1 තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.

8.0 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේනම් ගෙවන ලද විභාග ගාස්තුව :
8.3 තැපැල්/උපතැපැල් හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය :————.
8.4 ලදුපත් අංකය :————.
8.5 දිනය :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

9.0 අයදුම්කරුගේ සහතිකය :
ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, මා විභාගයට පෙනී සිටින්නේ ............... වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/රුපියල් ................ක විභාග ගාස්තුව ............... තැපැල්/උපතැපැල් හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට ............... දින ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට හා විභාග පනතේ සියලු විධිවිධානයන්ට) මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සටහන : තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .................................... මහතා/මහත්මිය/මෙනවිය .................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, ඔහු/ඇය විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කිරීමට සුදුසු බවත්/නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
(ii) මෙම නිලධාරියා/නිලධාරිනිය* ඒකාබද්ධ සේවයට අයත් බවත්/සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති බවත්,
(iii) නිලධාරියා/නිලධාරිනිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/නොසිටි* බවත්,
(iv) නිලධාරියා/නිලධාරිනිය* මෙය පෙර විභාගයට පෙනී සිට ඇති නිසා නියමිත විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,
(v) නිලධාරියා/නිලධාරිනිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

මම සහතික කරමි.

* අනවශ්‍ය වචන කපා හරින්න.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

09-644

---

**ඉඩම් අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2020**

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු :

වගුව - අංක 01 - බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු

| අනු. අංකය | තනතුරු නාමය | | පිරවීමට තිබෙන පුරප්පාඩු ගණන | බඳවා ගන්නා ශ්‍රේණිය |
|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි පරිපාලක | කොළඹ ප්‍රධාන කාර්යාලයේ පමණක් පවතින තනතුරු වේ. මුළු සේවා කාලය තුලම ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතු වේ. | 01 | III ශ්‍රේණිය |
| 02 | ප්‍රවාහන නිලධාරි | | 01 | III ශ්‍රේණිය |

1.2 තනතුරුවල රාජකාරි ස්වභාවය :
වගුව අංක 02 - තනතුරුවල රාජකාරි ස්වභාවය

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *රාජකාරි ස්වභාවය/ප්‍රධාන කාර්යයන්* |
|---|---|---|
| 1. | ගොඩනැගිලි පරිපාලක | ● වාර්ෂික ගොඩනැගිලි නඩත්තු සැලැස්ම සකස් කිරීම<br>● ගොඩනැගිලි නඩත්තු ක්‍රියාවලිය කළමනාකරණයට යෝජනා කිරීම<br>● සේවක කණ්ඩායම් සුපරීක්ෂාව<br>● නඩත්තුවලට අවශ්‍ය අමුද්‍රව්‍ය, උපකරණ ගබඩා කිරීම හා කළමනාකරණය<br>● ගෙවීම් කටයුතු සඳහා මිනුම් ගැනීම සහ නිර්දේශ ලබා ගැනීම |
| 2. | ප්‍රවාහන නිලධාරී | ● දෙපාර්තමේන්තුව සතු වාහන ධාවනයට සුදුසු තත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික තොරතුරු සපයා දීම<br>● අළුත්වැඩියාවන්ට අවශ්‍ය නිර්දේශ සහ කාර්මික වාර්තා ලබා දීම<br>● අළුත්වැඩියා වලින් පසු වාහනවල ධාවන තත්වය පරීක්ෂා කිරීම, වාහන නඩත්තුව පිළිබඳ පරීක්ෂා කිරීම<br>● රියදුරන්ට උපදෙස් දීම<br>● රිය අනතුරුවලදී වහා පරීක්ෂා කර බලා වාර්තා ලබාදීම සහ අබලන් වාහන ගර්හිත කිරීම ආදී කටයුතු<br>● පරිසර හිතකාමී සහතික ලබා ගැනීම සඳහා වාහන සැකසීම |

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 වැටුප :
වගුව අංක 03

| ශ්‍රේණිය | වැටුප් පරිමාණය | ආරම්භක මාසික වැටුප |
|---|---|---|
| III ශ්‍රේණිය | මාසිකව රු 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550 (එම් එන් 3 - 2016) | රු. 24,626(රා.ප.ච.03/2016 හි උපලේඛන II විධිවිධාන අනුව) |
| II ශ්‍රේණිය | මාසිකව රු. 31,040 - 10 x 445- 11 x 660 - 10 x 730 -10 x 750- රු. 57,550 (12 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ.) (එම් එන් 3 - 2016) | රු. 28,684 (රා.ප.ච. 03/2016 හි උපලේඛන II විධිවිධාන අනුව) |
| I ශ්‍රේණිය | මාසිකව රු.31,040 - 10 x 445- 11 x 660 -10 x 730 - 10 x 750 - රු. 57,550 (23 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ.) (එම්එන් 3 - 2016) | රු. 34,506, (රා. ප. ච. 03/2016 හි උපලේඛන II විධිවිධාන අනුව) |

4.0 මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, මෙම තනතුරු කොළඹ ප්‍රධාන කාර්යාලයේ පවතින තනතුරු වන බැවින් මුළු සේවා කාලය තුලම ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතුය. මෙම *ගැසට් නිවේදනයේ* ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීම්වලට අදාල වන පොදු කොන්දේසිවලට යටත් විය යුතුය.

5.0 සුදුසුකම් :

5.1 *මූලික සුදුසුකම් :*

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම,
(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 30 වේ.

5.2 *අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

(ආ) සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් දෙක (02) සහිතව විෂයයන් තුන (03) කින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම.

5.3 *වෘත්තීය සුදුසුකම්* :

ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා යාන්ත්‍රික ක්ෂේත්‍රයෙන්ද ගොඩනැගිලි පරිපාලන තනතුර සඳහා සිවිල් ක්ෂේත්‍රයෙන්ද පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ලබා තිබීම.

(අ) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

හෝ

(ආ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව;

හෝ

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

(ඈ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

හෝ

(ඉ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

හෝ

(ඊ) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

හෝ

(උ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.4 *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයෙකුම සිය තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*සටහන* :

සෑම අයදුම්කරුවෙකුම තනතුරුට අදාල සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.0 *සාවද්‍ය තොරතුරු සැපයීම* :
මෙම විභාගය සඳහා ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවාගත් පසුව වුවද අපේකෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

7.0 *බඳවා ගැනීමේ ක්‍රමය* :
7.1 ලිඛිත විභාගය :
විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය වලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබෙන අතර, විභාගය කොළඹදී පමණක් පැවැත්වේ.

| | ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය |
|---|---|---|
| (i) බුද්ධි පරීක්ෂණය | 100% | 40% |
| (ii) විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100% | 40% |

7.2 *විෂයය නිර්දේශය* :

I. බුද්ධි පරීක්ෂණය : අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.
II. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය :

ගණිතය :
වීජ ගණිතය (අසමානතා, විචල්‍ය, ශ්‍රේණි, ලඝුගණක)
ත්‍රිකෝණමිතිය (සමීකෂණ, ත්‍රිකෝණ විසඳීම)
සංඛ්‍යානය (මධ්‍යන්‍යය, මාතය, සම්මත අපගමනය, සම්භාවිතාව)

භෞතික විද්‍යාව :
ආලෝකය හා ප්‍රකාශ විද්‍යාව (පරාවර්තනය සහ වර්තනය : දර්පන චක්‍ර පෘෂ්ඨ, ප්‍රිස්ම කාච ප්‍රකාශ විද්‍යාවේ සූත්‍ර, අන්වීක්ෂය සහ දුරේක්ෂය) නිව්ටන් යාන්ත්‍ර විද්‍යාව (අදිශ සහ දෛශික, චලිතය පිළිබඳ නිව්ටන් නියම, ගම්‍යතාවය)

විවිධ මාතෘකා :
භූගෝල විද්‍යාව හැඳින්වීම (පෘථිවියේ හැඩය, භූ ලක්ෂණ ආදිය) ඝණ වස්තුවල කෝණික දෘෂ්ටිය සහ ප්‍රක්ෂේපණ ව්‍යුත්පන්න කිරීම.

8.0 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* :

8.1 සර්වේයර් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව ඉහලම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතරින්, පිරවීමට අපේක්ෂිත

පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

8.2 සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

9.0 *බඳවා ගැනීම.*- ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනේ.

10.0 *අයදුම්පත්‍ර සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම :*

(*අ*) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතුය. අංක 01 සිට 04 දක්වා ශීර්ෂ 01 පිටුවේද, අංක 04.1 - 10.1 දක්වා ශීර්ෂ 02 පිටුවේද, අංක 10.2 - 11.1 දක්වා ශීර්ෂ 03 පිටුවේද, අංක 12-14 දක්වා ශීර්ෂ 04 පිටුවේද, අංක 15 ශීර්ෂ 05 පිටුවේද ඇතුලත් වන පරිදි ඉල්ලුම්පත්‍රය සැකසිය යුතුය.

(*ආ*) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මගින්ද නියමිත දිනට හෝ පෙර ඉදිරිපත් කල යුතු වේ.

(*ඇ*) ඉල්ලුම්පත් සකස් කල යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ය.

(*ඈ*) **අයදුම්පත සමග ඔබගේ වෘත්තීය සුදුසුකම් තහවුරු කරෙන පාඨමාලා සහතික වල සහතික කරන ලද පිටපත් එවිය යුතුය.**

(*ඇ*) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති සහ නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොවර ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(*ඉ*) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

*සැ. යු.* : විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කල විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා 2020.10.23 දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියළු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සර්වේයර් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාග යට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිලිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදන අනුව සුදුසුකම් තිබේදැයි පිරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ ''තාක්ෂණ සේවයේ තනතුරු වලට බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිලිව සඳහන් කල යුතුය.

10.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චය කාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කල තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.0 *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 800 කි. මෙම මුදල කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට හෝ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය - දියතලාව වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ. රිසිට්පත් නොමැති ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.0 *අයදුම්පත්‍ර යොමු කිරීම :*

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2020.10.23 වැනි දින හෝ ඊට පෙර පහත දක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සර්වේයර් ජනරාල්,
විභාග අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 150,
කොළඹ 05.

13.0 *විභාගයට පෙනී සිටීම :*

විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාග යට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු

තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතුය.

14.0 *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය* :

විභාග ශාලාවේදීම තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත. :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඒ. එල්. ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා.
සර්වේයර් ජනරාල්.

2020.09.17 දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*ඉඩම් අමාත්‍යාංශය*

**මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

***මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය***

ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද ඇතුලත් කළ යුතුය.

☐
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල -1
දෙමළ -2 ☐
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අයදුම්කරනු ලබන තනතුර (ඉදිරියෙන් ඇති කොටුව තුළ X ලකුණ යොදන්න)

ගොඩනැගිලි පරිපාලක ☐

ප්‍රවාහන නිලධාරී ☐

1.0 1.1. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා* : PERERA , A. B. C.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

1.5 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

1.6 2020.10.23 වැනි දිනට වයස : අවු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

1.7 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 2 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.8 විවාහක/අවිවාහක බව : විවාහක ☐ අවිවාහක ☐

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 දුරකථන අංකය (තිබේනම්) :————.

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
3.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.

4.0 අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)

4.1 අ.පො.ස (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵලය :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4.<br>5. | | 6.<br>7.<br>8.<br>9.<br>10. | |

4.2 අ.පො.ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵලය :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1.<br>2. | | 3.<br>4. | |

5.0 වෘත්තීය/තාක්ෂණික සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)
5.1 හදාරා ඇති උපාධිය/පාඨමාලාව :————.
5.2 උපාධිය/පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම :————.
5.3 උපාධියේ/පාඨමාලාවේ කාලය :————.

6.0 වෙනත් සුදුසුකම් :

..........................................................................................................
..........................................................................................................

7.0 ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වැරදිකරු කරනු ලැබ තිබේද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

7.1 'ඔව්' නම් විස්තර සඳහන් කරන්න. :————.

8.0 අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයෙක් නම් එසේ ඉවත් වීමට හේතුව :————.

9.0 විභාග ගාස්තු ගෙවීම් පිළිබඳ විස්තර ඃ

9.1 විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :————.

9.2 ලදුපත් අංකය හා දිනය :————.

9.3 ගෙවූ මුදල රු.:————.

| |
|---|
| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.) |

10.0 අයදුම්කරුගේ සහතිකය ඃ

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවරුදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වේ. තවද, මෙහි සියලු කොටස් සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කර සිටිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙහි අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................. මයා/මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ......... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි.)

12.0 දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරන නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ.

දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ........ .........මයා/මිය/මෙය ............... දෙපාර්තමේන්තුවේ/ආයතනයේ . ............... දින සිට ......... දින දක්වා .................. වශයෙන් සේවය කරන අතර, ඔහුට/ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත/නැත. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය .................. තනතුර සඳහා තොරා ගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

09-810

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය - 2019 (2020)

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 3 සේවා ගණයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 14 |
| 02 | උන්නත මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 03 |
| 03 | පෙර මුද්‍රණ සැලසුම්කරු | 01 |
| 04 | කොම්පියුටර් ටයිප් සෙටර් සහ මුද්‍රණ රටා සිත්තම්කරු | 08 |
| 05 | මුද්‍රණ නිමැවුම්කරු | 02 |
| 06 | මුද්‍රණ කාර්මික | 02 |

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පමණක් පවත්වනු ලබන ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයක හා තනතුරට අදාළ ප්‍රායෝගික දැනුම හා කුසලතාව මැන බැලෙන වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන් කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. එහිදී විභාග කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද (අංක 05 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

02. *සුදුසුකම්* :

I. *සාමාන්‍ය සුදුසුකම් :*

- අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.
- යම් ආගමික නිකායක පැවිදිවරයකු නොවිය යුතුය.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන් හි V වැනි පරිච්ඡේදය අනුව රාජ්‍ය සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තකු නොවිය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- දිවා රාත්‍රී රාජකාරි ඉටු කිරීමට සිදු වන බැවින් පිරිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.
- ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. ඒ අනුව 2002.10.26 දිනට හෝ ඊට පෙර හා 1985.10.26 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

II. *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට (02) සම්මාන සාමර්ථ්‍ය සහිතව එක් වරක දී විෂයන් හයකින් (06) සමත් වීම.

(ආ) කොම්පියුටර් ටයිප් සෙටර් හා මුද්‍රණ රටා සිත්තම්කරු තනතුර සඳහා පමණක් ඉහත (අ) හි සුදුසුකම්වලට අමතරව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමර්ථ්‍යක් ලබා තිබීම අවශ්‍ය වේ.

III. *වෘත්තීය සුදුසුකම්* :

(අ) 3 පන්තියේ III ශ්‍රේණියේ මුද්‍රණ කාර්මික තනතුර සඳහා මුද්‍රණ කාර්මික හා/හෝ විදුලි කාර්මික ක්ෂේත්‍රයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 5 මට්ටමේ සහතිකය හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන ඉහත ක්ෂේත්‍රවලට අදාළව හදාරා ලබා ගත් වෙනත් සහතිකයක් තිබීම.

(ආ) 3 පන්තියේ III ශ්‍රේණියේ අනෙකුත් සියලුම තනතුරු සඳහා ඒ ඒ තනතුරුවලට අයත් ක්ෂේත්‍රයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 5 මට්ටමේ සහතිකය හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන ඉහත ක්ෂේත්‍රවලට අදාළව හදාරා ලබාගත් වෙනත් සහතිකයක් තිබීම.

(ඇ) මුද්‍රණ නිමැවුම්කරු තනතුර සඳහා ඉල්ලුම්කරන අයදුම්කරුවන් අතුරින්, කැමරාවෙන් ලබා ගන්නා දළ සේයා පට මුද්‍රණ තහඩුවල පිටපත් කිරීම, පිටපත් කරන ලද මුද්‍රණ තහඩුව වැඩිදියුණු කිරීම (Develop), අත්පිටපතක් හෝ මුද්‍රිත පිටපතක් මුද්‍රණය කිරීම සඳහා අච්චු අකුරු ඇමිණීම (වර්ණ යෝජනය කිරීම) සහ ෆෝසස් කැමරා ක්‍රියා කරවීම සම්බන්ධයෙන් හැකියාව දක්වන අයදුම්කරුවන් හට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

IV. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

II. මෙම තනතුරු ශ්‍රී ලංකා විහාග දෙපාර්තමේන්තුවට සීමා වූ තනතුරු වේ.

III. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට පත්වී වසර 03ක් ඇතුළත ශ්‍රී ලංකා විහාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථාවේ 3 වන උපලේඛනයේ දැක්වෙන පරිදි 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

IV. ශ්‍රී ලංකා විහාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් නීති රීති හා කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් විධිවිධාන හා නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

V. සේවා අවශ්‍යතාව මත දිවා රාත්‍රී දෙකෙහිම සේවය කළ යුතු අතර පවතින රාජකාරි අනුව නිවාඩු දිනයන් හි ද නොපිරිහෙලා තම සේවය ලබා දීමට එකඟ විය යුතුය.

04. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රු.29,840-10x300-11x350-10x560-10x660-රු.48,890- (MT 1 - 2016) මාසික වැටුප් පරිමාණයක් හිමිය.

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ. :

මෙම සම්මුඛ පරීක්ෂණය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ලකුණු දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| I. අධ්‍යාපන සුදුසුකම් | 30 |
| II. වෘත්තීය සුදුසුකම් | 30 |
| III. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | 35 |
| IV. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 |
| මුළු ලකුණු | 100 |

ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණය ඇතුළත ලකුණු ලබා දීම සිදු කෙරේ. එම ලකුණු ප්‍රදානය කිරීම සඳහා වන විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම විහාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු අතර, අදාළ තනතුරුවල ස්වභාවය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් පසු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් කුසලතාව මැන බැලෙන වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ.

වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව, පවතින පුරප්පාඩුවලට බඳවාගනු ලැබේ.

06. *පරීක්ෂණ ගාස්තු :*

පරීක්ෂණ ගාස්තුව රු.250.00කි. මෙම මුදල විහාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 20-03-02-13 යටතේ 2020.10.26 දින හෝ එදිනට පෙර හෝ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට පමණක් ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතෙහි ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ඉදිරිපත් කරනු ලබන එක් එක් අයදුම්පත සඳහා වෙන වෙනම පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතුය. කුමන හේතුවක් නිසාවත් පරීක්ෂණ ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

07. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

i. අයදුම්පත් 2020.10.26 දිනට හෝ එදිනට ප්‍රථම "විහාග කොමසාරිස් ජනරාල්, ආයතන ශාඛාව, ශ්‍රී ලංකා විහාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පතේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A 4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුවේ අංක 01 සිට 06 තෙක් ඡේදයන් ද, ඉතිරි ඡේදයන් සෙසු පිටුවලට ද ඇතුළත් වන සේ පිළියෙල කර ගත යුතුවේ. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

*නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත යොමු කිරීමට ප්‍රථම එය විහාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත පරීක්ෂණ ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත්කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් අයදුම්කරු විසින් විමසා බලා තහවුරු කර ගත යුතු වේ.

iii. අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2019 (2020)" ලෙස සඳහන් කර එවිය යුතුය. තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

iv. අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතීඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

v. මේ සමග ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.අයදුම්පත් තැපෑලේදී නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

08. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම* :

i. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරීක්ෂණ ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම් ලිපි නිකුත් කරනු ඇත.

ii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා කැඳවීම් ලිපියක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බව පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

iii. අයදුම්කරුවන් වෙත කැඳවීම් ලිපි නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් තම කැඳවීම් ලිපිය නොලද අපේක්ෂකයකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමගං, ෆැක්ස් මගින් කැඳවීම් ලිපියේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

iv. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

09. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව* :

අපේක්ෂකයින් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව පැමිණිය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ඇතුළත් කර නොගැනේ. තවද සම්මුඛ පරීක්ෂණය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

බී. සනත් පූජිත,
විභාග කොමසාරිස් ජනරාල්.

2020 සැප්තැම්බර් මස 18 වැනි දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය 2019 (2020)

Structured Interview for Recruitment to Grade III Posts of Management Assistant Technological Segment 3 Service Category - 2019 (2020)

(අංක හෝ සංකේත සඳහන් කළයුතු අවස්ථාවලදී දෙන ලද කොටුව තුළ පැහැදිලිව හා නිවැරදිව සංකේතය / අංකය සටහන් කරන්න)

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

සිංහල - 2 / දෙමළ - 3 /ඉංග්‍රීසි - 4

| |
|---|

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

| ඉල්ලුම් කරන තනතුර | |
|---|---|

(අයදුම් කරන තනතුරට අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

| *තනතුරු නාමය* | *අංකය* |
|---|---|
| 1. ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 1 |
| 2. උන්නත මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 2 |
| 3. පෙර මුද්‍රණ සැලසුම්කරු | 3 |
| 4. කොම්පියුටර් ටයිප් සෙටර් සහ මුද්‍රණ රටා සිත්තම්කරු | 4 |
| 5. මුද්‍රණ නිමැවුම්කරු | 5 |
| 6. මුද්‍රණ කාර්මික | 6 |

1. 1.1 සම්පූර්ණ නම :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   1.2 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා* :- BANDARA A.B.C
   1.3 සම්පූර්ණ නම :————.
   (සිංහලෙන්/දෙමළෙන්)

2. 2.1 ස්ථිර පදිංචි ලිපිනය :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   2.2 ස්ථිර පදිංචි ලිපිනය :————.
   (සිංහලෙන් / දෙමළෙන්)
   2.3 කැඳවීම් ලිපිය එවිය යුතු ලිපිනය :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3. ස්ත්‍රී / පුරුෂ භාවය : ☐ පුරුෂ - 0 ස්ත්‍රී - 1

4. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

5. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

6. 6.1 උපන් දිනය :

   වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

6.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයසඃ (2020.10.26)

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

7. විවාහක / අවිවාහක බව ඃ ☐ විවාහක - 01 අවිවාහක - 02

8. අධ්‍යාපන සුදුසුකම් ඃ

8.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය

විභාගයට පෙනී සිටි වර්ෂය හා මාසය :————.

විභාග අංකය :————.

| විෂයය | සාමර්ථ්‍ය | විෂයය | සාමර්ථ්‍ය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

9. වෘත්තීය සුදුසුකම් ඃ

| පාඨමාලාව | හැදෑරූ වර්ෂය | තාක්ෂණික ආයතනය | NVQ මට්ටම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

9.1 ඔබ විසින් ඉදිරිපත් කරන සෑම සහතිකයක්ම කුමන NVQ මට්ටමකින් පිළිගනු ලබන්නේ ද යන්න පිළිබඳව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් ලබාගත් ලිපියක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

10. අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද ඃ

..............................................................................................................

11. වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඃ

..............................................................................................................

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. ඃ

..............................................................................................................

13. පරීක්ෂණ ගාස්තු ගෙවීම පිළිබඳ විස්තරඃ

13.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලයේ නම :————.

13.2 ලදුපත් අංකය හා දිනය :————.

13.3 ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

14. අයදුම්කරුගේ සහතිකය ඃ

14.1 මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකග වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

14.2 ම විසින් සපයන ලද යම් තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

14.3 තව ද, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

14.4 මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

ඉහත නම සඳහන් ............................................................ මහතා/ මහත්මිය / මෙනවිය මා හොඳින් දන්නා බවත්, අද දින මා ඉදිරිපිට දී ඔහුගේ / ඇයගේ අත්සන තබන ලද බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව

තනතුර :————.
නම :————.
ලිපිනය :————.
දිනය :————.

16. දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් පමණක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පහත සඳහන් සහතිකය සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඃ

ඉහත විස්තර සඳහන් ...................................................... මහතා/ මහත්මිය /මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු / ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

09-821

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.